
# නව අරහාදී බුදුගුණ

**ඉතිපි සෝ භගවා - අරහං, සම්මාසම්බුද්ධෝ, විජ්ජාචරණසම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්මසාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධෝ, භගවා.**


**<u>අරහං</u> ගුණය :-**

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ, සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක. රහසින්වත් පව් නොකළ සේක. සියලු පාපයන්ගෙන් මිදුණු සේක. ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා සියල්ලටම සුදුසුවන සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ "**අරහං**" වන සේක.





**<u>සම්මාසම්බුද්ධ</u> ගුණය :-**

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ, සසර දුක ත්, දුක ඇතිවීමට හේතුව ත්, දුක නැති කිරීම ත්, දුක නැති කිරීමේ මාර්ගය ත් යන චතුරාර්ය සත්‍යය ගුරු උපදේශ නැතිවම අවබෝධ කොට අමා මහ නිවන සාක්ෂාත් කළ සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ "**සම්මාසම්බුද්ධ**" නම් වන සේක.




<u>විජ්ජාචරණසම්පන්න</u> ගුණය :-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමෙන් ලැබුවාවූ කෙලෙසුන් දුරුකළ නුවණ ද, සියලු භවයන් දකින්නා වූ නුවණ ද, සියලු පෙර ජීවිත දකින්නා වූ නුවණ ද, ප්‍රාතිහාර්ය පෑමේ නුවණ ද, ආදී විද්‍යා ධර්මයන් ද ශීලයෙන් ඇති කර ගත්තා වූ සංවරය ද, භාවනාවෙන් ඇති කර ගත්තා වූ සමාධි බලය ද, නුවණින් ඇති කර ගත්තා වූ ප්‍රඥා බලය ද ආදී චරණ ධර්මයන්ගෙන් ද යුතු වූ හෙයින් බුදුරජාණන් වහන්සේ **"විජ්ජාචරණසම්පන්න"** නම් වන සේක.





<u>සුගත</u> ගුණය :-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ, රාග, ද්වේශ, මෝහ යන අකුසල ධර්මයන් දුරු කිරීම පිණිස වූ මධ්‍යම ප්‍රතිපදාවෙහි වැඩම කොට එම අකුසල දහමින් සිත මුදවා ගත් සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ **"සුගත"** නම් වන සේක.




## <u>ලෝකවිදූ</u> ගුණය :-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ, සියලු ලෝකයන්ගේ යථා ස්වභාවය අවබෝධ කොට වදාළ සේක. නිරයෙහි ස්වභාවය ද එහි උපදින්නා වූ හේතුව ද තිරිසන් ලෝකයෙහි ස්වභාවය ද එහි උපදින්නා වූ හේතුව ද ප්‍රේත ලෝකයෙහි ස්වභාවය ද එහි උපදින්නා වූ හේතුව ද මිනිස් ලොව ස්වභාවය ද එහි උපදින්නා වූ හේතුව ද දෙව්ලොව ස්වභාවය ද එහි උපතට හේතු වූ කරුණු ද බඹලොව ස්වභාවය ද එහි උපතට හේතු වූ කරුණු ද සියලු ලෝකවල ස්වභාවය ද එහි උපතට හේතු වූ කරුණු ද අවබෝධ කළ සේක. එම හේතුන් නැති කිරීමෙන් සියලු ලෝකයන්ගෙන් නිදහස් විය හැකි බව ද අවබෝධ කොට වදාළ සේක. එසේම භාග්‍යවතුන් වහන්සේ සියලු ලෝකයන්ගෙන් ද සියලු භව බන්ධනයන්ගෙන් ද නිදහස් වූ සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ **"ලෝකවිදූ"** වන සේක.





## <u>අනුත්තරෝ පුරිසදම්මසාරථී</u> ගුණය :-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ දමනය කළයුතු වූ සංසාරගත සත්වයන් දෙස, (මනුලොව හෝ වේවා, දෙව්ලොව හෝ වේවා, බඹලොව හෝ වේවා) මහත් වූ කරුණාවෙන් හා අනුකම්පාවෙන් බලන සෙක. ඍද්ධි ප්‍රාතිහාර්යෙන් ද ආදේශනා ප්‍රාතිහාර්යෙන් ද චතුරාර්ය සත්‍යය , ධර්මයන් විස්තර කරන්නා වූ අනුශාසනා ප්‍රාතිහාර්යෙන් ද සමන්විත වන භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ ප්‍රාතිහාර්ය මගින් දමනය කළහැකි දෙව් - මිනිස් - බඹ ආදී සත්වයන් දමනය කොට නිවන් මඟට පමුණුවන සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ **"අනුත්තරෝ පුරිසදම්මසාරථී"** නම් වන සේක.



<u>සත්ථා දේවමනුස්සානං</u> ගුණය ඃ-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ සියලු දෙවියන්ට ද සියලු මනුෂ්‍යයන්ට ද දුක කුමක්දැයි (ඉපදීම, වයසට යෑම, ලෙඩ වීම, මරණය, ශෝක, පරිදේවය) පෙන්වා වදාළ සේක. දුකට හේතුව පෙන්වා වදාළ සේක. දුකින් මිදීම හා දුකින් මිදීමේ මාර්ගය (ආර්ය අෂ්ඨාංගික මාර්ගය) පෙන්වා වදාළ සේක. මෙලොව හා පරලොව සැනසිල්ල ද පෙන්වා වදාළ සේක. මෙසේ ලොවට මහා පිළිසරණක් වූ අන්ධකාර ලෝකයාට සූර්යයා බඳු වූ පිපාසිත ලෝකයාට අමා වැස්සක් බඳු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු දෙව් මිනිසුන්ට අනුශාසනා කළ සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ **"සත්ථා දේවමනුස්සානං"** නම් වන සේක.





<u>බුද්ධ</u> ගුණය ඃ-

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ අවබෝධ කළයුතු වූ චතුරාර්ය සත්‍යය ධර්මයන් (දුක, දුක ඇතිවීමට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය) අවබෝධ කොට සියලු දෙව් මිනිසුන්ටද ධර්මය අවබෝධ කරවීම පිණිස ඉර-හඳ සේ ඉතා පැහැදිලි කොට පෙන්වා වදාළ සේක. කිසිත් සඟවා නොගත් සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ "බුද්ධ" නම් වන සේක.



**<u>භගවා</u> ගුණය :-**

ඒ භාග්‍යවත් අරහත් බුදුපියාණන් වහන්සේ පංච මාරයන් බෝධි මූලයේදී පරාජය කළ සේක. ස්කන්ධ, ආයතන, ධාතු, චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය ආදී ගැඹුරු දහම් බෙද දක්වමින් අන් අයට අවබෝධ කළ හැකි ආකාරයට ඉතා සරලව දහම් දෙසූ සේක. අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා හා අනේක වූ භාග්‍ය ධර්මයන්ගෙන් යුක්ත වන සේක. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ "**භගවා**" නම් වන සේක. භාග්‍ය යනු ඉතා මහත් වූ ගෞරව නාමයක් ද වේ.




**සාධු ! සාධු !! සාධු !!!**

නිර්මාණය - දිස්නා කුමාරි මිය